පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නාට්‍ය හා රංග කලාව

9 ශ්‍රේණිය

02 වන වාරය, මැයි 04 වන සතිය

සැකසුම -එස්.එස්.සී.ජයසූරිය

Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

# සති පාසල කාර්‍ය පත්‍රිකාව

**1. නිපුණතාව 3.0 :** නාට්‍ය හා රංගකලා සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැලෙයි.

**නිපුණතා මට්ටම 3.5 :** සාත්වික අභිනය භාවිතා කරයි.

**පාඩම :** සාත්ත්වික අභිනය භාවිත කරමු

## 2.ශිෂ්‍යයා විසින් කල යුතු කාර්‍යයන්:

- සාත්වික අභිනය හඳුනා ගැනීම.
- ලෝකධර්මී සහ නාට්‍යධර්මී නාට්‍ය වල සාත්වික අභිනය භාවිතා කර ඇති ආකාරය හඳුනා ගැනීම.
- පහත දී ඇති ඉගෙනුම් පත්‍රිකා හා අනෙකුත් ඉගෙනුම් ආධාරක ඇසුරෙන් දී ඇති ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න.

- සපයා ඇති ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු කරමින් සාත්වික අභිනය හොඳින් පුහුණු වන්න.

- පාසල ආරම්භයේදී ඔබගේ අනාවරණයන් පන්තිය ඉදිරියේ ඉදිරිපත් කරන්න.

**3.ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත, කියවීම් පත්‍රිකා, Websites සහ ඉගෙනුම් ආධාරක :-**

- **eතක්සලාව -**
  https://www.e-thaksalawa.moe.gov.lk/web/en/

- **eනැණපියස -**
  course : 09 ශ්‍රේණිය නාට්‍ය හා රංගකලාව
  https://enenapiyasa.lk/

- **You Tube –**
  https://youtu.be/tCJ2CJQEAbg

- **Website -** https://www.google.com/search?q=sattvika+abhinaya&oq=sathvika+a&aqs=chrome.1.69i57j0i10j46j0j46i10i175i199.5414j0j9&client=ms-android-huawei-rev1&sourceid=chrome-mobile&ie=UTF-8

- **කියවීම් පත්‍රිකාව -**

## සාත්වික අභිනය භාවිත කරමු.

නළුවා චරිතයට අදාලව මුහුණෙන් හැඟීම් හා අදහස් ප්‍රකාශ කිරීම සාත්වික අභිනයයි. ආදරය, කරුණාව, කෝපය, ශෝකය, බය ,ජුගුප්සාව, වෛරය වැනි මනෝභාවයන් ප්‍රේක්ෂකයා ඉදිරියේ මැවෙන්නේ සාත්වික අභිනය හරහා ය. මුහුණේ මස්පිඩු, නළල, ඇහිබැම, ඇස, කන, නාසය, නිකට, තොල් වැනි ඉන්ද්‍රියන් තුළින් මනෝභාවයන් ප්‍රකට වේ. සාත්වික අභිනය යනු මනස මූලිකව හටගන්නා භාවයන් ශාරීරික වශයෙන් ප්‍රකට කරවීමයි. මෙම වෙනස්කම් චරිත වල පාලනය පාලනයෙන් තොරව සිදු වේ.

උදා :- දහදිය දැමීම, ඇඟ වෙව්ලීම, රෝමෝද්ගමනය, සිරුර දරදඬු වීම, ගැස්ම ආදිය වේ.

නාට්‍යක සාර්ථකත්වය සඳහා සාත්වික අභිනය බලපාන අතර චරිතයක අභ්‍යන්තරය හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා බෙහෙවින්ම උපකාරී වේ.වෙස්මුහුණු පළඳින පවතින අවස්ථාවකදී සාත්වික අභිනයට බාධා සිදුවේ. නාට්‍යයේ ශෛලිය හා ප්‍රභේදය අනුව ද සාත්වික අභිනයේ වෙනස්කම් සිදුවේ. විවිධ භූමිකා මගින් ප්‍රකට සාත්වික අභිනය විවිධ වේ. චරිතයක ප්‍රබල හෝ දුබල බව ඉස්මතු වීම කෙරෙහි සාත්වික අභිනය ප්‍රධාන වශයෙන්ම බලපා යි. සාත්වික භාව නිරූපණය වඩාත් ප්‍රබල වීමට, මැනවින් ඉදිරිපත් කිරීමට, ඒ සමඟ වාචික, අංගික, ආහාර්යඅභිනය ද එක්විය යුතුය.

**4.මෙම සතියට නියමිත පාඩම මඟින් ආවරණය විය යුතු ඉගෙනුම් ඵල:**

- සාත්වික අභිනය යනු කුමක්දැයි හඳුනා ගැනීම.
- ලෝකධර්මී හා නාට්‍යධර්මී නාට්‍ය වල සාත්වික අභිනය භාවිතා කර ඇති ආකාරය හඳුනා ගැනීම.
- සාත්වික අභිනය නිවැරදිව නිරූපණය කිරීම.

**5.ඇගයීම /තක්සේරකරණ ක්‍රමවේදය හා ආකෘති:**

1. සාත්වික අභිනය යනු කුමක්දැයි හඳුන්වන්න.
2. නළුවකු ගේ මනෝභාවයන් ප්‍රකට කෙරෙන ශාරීරික අංගයන් ලියන්න.
3. පහත සඳහන් හැඟීම් දැනෙන විට ඔබගේ මුහුණට හා ශරීරයට සිදුවන වෙනස්කම් සොයා බලන්න.
    - දුක
    - සතුට
    - කෝපය
    - භය
    - පිළිකුල
    - ලැජ්ජාව

4. ඉහත හැඟීම් සහිත මුහුණු සටහන් පොතේ අඳින්න.
5. පහත දැක්වෙන ක්‍රියාකාරකම් සිදු කර සාත්වික අභිනය හොඳින් පුහුණු වන්න.

1. (දුක) නිවසේ බල්ලා නොනවත්වා ම බුරමින් සිටී. ගෙහිමියා පැමිණ බල්ලාට සැර කර ඌ ලිහා දමයි. ඌ වහා පාරට පනියි. පාරේ ගමන් ගන්නා වාහනයකට බල්ලා අහු වෙයි. බල්ලා දෙස බලා ගෙහිමියා ඇතුළු පවුලේ සියලුදෙනා දැඩි ලෙස දුකටත් කම්පනයටත් පත් වෙති.
2. (බිය) නිවසේ දොරට යමෙක් තට්ටු කරයි. ගෙහිමි කාන්තාව වසා තිබූ දොර ඇර බලයි. එවිට දකින්නේ යකෙකුගේ ස්වරූපය ඇත්තෙකි. ගෙහිමි කාන්තාව දැඩි ලෙස බිය වී කෑ ගසයි.
3. (සතුට) තැපැල්කරු නිවසට පැමිණෙයි. සීනුව නාද වෙයි. එක් දැරියක් තැපැල්කරු වෙත දිව යයි. තැපැල්කරු ලිපියක් දිගු කරයිත දැරිය එය කඩා බලයි. සතුට දනවන කරුණක් ලිපියේ ඇති බව පෙනේ. ක්‍රමයෙන් ලිපිය කියවීමේ දී මුහුණේ ඉරියව් වෙනස් වී අධික සතුටක් ඇති වන අයුරු පෙනේ. සතුට ඉහවහා ගොස් ලිපියේ සඳහන් දේ අන්‍යයන්ට ප්‍රකාශ කිරීමට කෑ ගසමින් නිවසට දිව එයි. නිවසේ සියල්ලෝ ම ලිපිය බලා සතුට ප්‍රකාශ කාරති.
4. (පිළිකුල) ළමයෙක් දිය නෑමට ළිඳට යයි. ළිඳට බාල්දිය දැමීමට හදන අවස්ථාවේ ළිඳ තුළ යමක් පෙනේ. ඇය ළිඳට එබිකම් කර බලයි. අයට සිටින්න්ට ද කථා කරයි. සියල්ලෝම ළිඳට එබී බලති. යමෙක් අසල තිබූ කොක්කක් සහිත ලීයක් ළිඳට දමා අමාරුවෙන් යමක් ගොඩ ගනී. ලීයේ පැටලී ඇත්තේ පූසෙකි. "පූසෙක්" යැයි අවට සිටින්නෝ කෑ ගසති. පූසා මිය ගොස් ය. ඌ ඉදිමී ගඳ ගසන බව අයෙක් පවසති. ඇතැමෙක් පිළිකුල අභිනයෙන් දක්වති.
5. (ආදරය) මවට ඉපදුණු අලුත් මල්ලී අද නිවසට ගෙනෙන දවසයි. එක් දරුවෙක් අම්මාත් තාත්තාත් මල්ලී ගෙනෙන තුරු මඟ බලමින් සිටී. (වාහනයක ශබ්දයක් ඇසෙයි) දරුවා ඇත මෑත බලයි. අම්මා මල්ලී තුරුලු කරගෙන එනු පෙනේ. දරුවා සතුටින් උඩ පනී. ඔහු අම්මා එන ඉදිරියට දිව යයි. අම්මා අත පහත් කර චූටි මල්ලියා දරුවාට පෙන්වයි. ඔහුට ඉමහත් සතුටක් දැනෙයි. ගෙදර සියල්ලෝ ම දුවවිත් අලුත උපන් බිළිඳාගේ හැඩරුව බලා සතුටු වෙති.

**සැකසුම :- S.S.C ජයසූරිය**

**ර/නිවි/සිංහලගොඩ විද්‍යාලය**